# ලන්දේසි සමයයේ භාවිත කළ ගෘහ උපකරණ පිළිබඳ ව කොළඹ කොටුවේ පිහිටි ඕලන්ද කටුගේ ඇසුරින් කෙරෙන විමර්ශනයක්

ජේ. ආර්. එස්. ජයලත්[1]

ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ලන්දේසීන් පාලනයට යටත් වූයේ ක්‍රි. ව 1658-1796 යන කාල සීමාවේ දී ය. එකල ලන්දේසීන් භාවිත කළ විවිධ ගෘහ උපකරණ පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට කොළඹ කොටුවේ කුමාර වීදියේ පිහිටි ඕලන්ද කටුගෙයි තිබෙන ගෘහ භාණ්ඩ වැදගත් වේ. යුග ගණනක් පැරැණි වුවත් ශක්තියෙන් හා අලංකාරයෙන් නොඅඩු ඕලන්ද දැවමය ගෘහ භාණ්ඩ මිල කළ නොහැකි වස්තූන් ලෙස සැලකිය හැකි ය. මේවා අතර කලාත්මක බවින් යුතු ලියන මේස, අත්පුටු, කැබිනට්, අල්මාරි, පෙට්ටගම් ආදිය වේ. කළුවර, කොස්, බුරුත, නැඳුන් ආදි වටිනා දැව වර්ගවලින් සැකසූ මේ භාණ්ඩ වර්තමානයේ ද ඉහළ වටිනාකමක් දරයි. එමෙන් ම මුළුතැන්ගෙයි ඇති භාණ්ඩ අතර වීදුරු හා පිඟන් දැකුම්කලු අංග වේ. ඔවුන්ගේ ප්‍රභූ ජන ජීවිතයට අදාළ වර්ණවත් සිතුවම් චිත්‍රණය කර තිබීම හා සීරීමෙන් චිත්‍ර කැටයම් කර තිබීම මේ වීදුරු භාණ්ඩවල දැකගැනීමට පිළිවන. එපමණක් නො ව ලෝහ භාවිතයෙන් කළ ආහාර පිසීමට යොදාගත් විවිධ රස කැවිලි අච්චු වර්ග, හැඳි ගැරුප්පු, දිය බඳුන්, කේතල් යනාදිය මුළුතැන්ගෙයි ඇති භාණ්ඩ අතර බහුල ව දැකගත හැකි ය. ඔවුන්ගේ වටිනා අභරණ යනාදිය තැන්පත් කිරීම සඳහා භාවිත කළ ඇත්දත් හා රිදී මඤ්ජුසා ද සියුම් කැටයමින් යුත් අලංකාර භාණ්ඩ වේ. ලන්දේසීන් තම නිවෙස් ආලෝකකරණය සඳහා භාවිත කළ මහේශාඛ්‍ය පෙනුමැති විශාල ඉටිපන්දම් පොකුරු පහන්, පොකුරු චිමිනි පහන්, ඕලන්ද කටුගේ පුරාවට දැකගත හැකි ය. මේ ආකාරයට ලන්දේසින් භාවිත කළ ගෘහ උපකරණවල ගොතික් ආභාසයෙන් යුත් ඇඹරුණු සර්පිලාකාර හැඩ, වක්‍ර හැඩ බහුල ව යොදා තිබීම විශේෂ ලක්ෂණයකි. ලන්දේසින්ට තම දෛනික කටයුතු ගෙන යාමේ දී මුහුදු වෙරළ ආශ්‍රිත ව නිතොර හමු වූ අංගයක් වූයේ සිප්පි කටුව යි. බහුල ලක්ෂණයක් වූ ඒ සිප්පි කටු හැඩය සැරැසිල්ලක් ලෙස තම පාරිහරික භාණ්ඩවලට එවක ශිල්පීන් යොදාගත් බව වැඩි වශයෙන් දැකිය හැකි ය. සමස්තයක් ලෙස ඕලන්ද කටුගෙයි තිබෙන ගෘහ උපකරණ ඇසුරින් එවායේ ඇති නිර්මාණශීලී බව, තාක්ෂණික ශිල්ප ක්‍රම, උපයෝගීතාව, ශිල්පීය දක්ෂතා යනාදිය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය. එමඟින් ඔවුන්ගේ සුඛෝපභෝගී ජන ජීවිතය පිළිබඳ තොරතුරු ලොවට හෙළිවන අතර ම යටත් විජිත ලංකාවේ තිබූ ප්‍රභූ නිවාසවල ලන්දේසි සමයයේ භාවිත ගෘහ උපකරණ ද ඒවායේ තිබූ මහේශාඛ්‍ය පෙනුම ද ප්‍රකට කරනුයේ අතීතයේ තවත් එක් අභිමානවත් යුගයකට උරුමකම් කී යටත්විජිත ඕලන්දවරුන්ගේ තේජස හා බලය යි.

**ප්‍රමුඛ පදඃ** ගෘහ උපකරණ, ඕලන්ද ආභාසය, ජන ජීවිතය, ආලෝකකරණය, සැරැසිලි

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසඟිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය